# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021**
**2024 නොවැම්බර්/ දෙසැම්බර්**
**සමාජීය විද්‍යා පීඨය**

**ආර්ථික විද්‍යාව**
**(අධ්‍යයන වර්ෂ 2007 සිට 2016 දක්වා)**

**ආර්ථිකවිද්‍යා මූලධර්ම ECON – E1015**

කැමති ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. අ) ආර්ථිකවිද්‍යා විෂයයෙහි ඇති ගතික ස්වභාවය පිළිබඳ එහි විකාශය ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) 'ආර්ථිකවිද්‍යාව යනු මිහිපිට ඇති සම්පත්වලින් අසීමිත වූ මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමට උත්සාහ කරන විග්‍රහයකි.'' මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 10)

02. අ) 'හිඟකම' යන්නෙන් අදහස් කෙරෙනුයේ කුමක්ද? නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ආශ්‍රයෙන් මෙම සංකල්පය පහදන්න. (ලකුණු 08)

ආ) ආවස්ථික පිරිවැය සහ ආවස්ථික පිරිවැය අනුපාතය අතර වෙනස උචිත නිදසුන් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

ඉ) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත ඇති සියලුම භාණ්ඩ සංයෝග නිෂ්පාදන කාර්යක්ෂමතාව පෙන්නුම් කළ ද සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව පෙන්නුම් කෙරෙනුයේ ඉන් එක් භාණ්ඩ සංයෝගයක් විසින් පමණක් වන්නේ ඇයි දැයි යෝග්‍ය රූප සටහනක් ආශ්‍රයෙන් විස්තර කරන්න. (ලකුණු 06)

03. පහත දැක්වෙන දෑ කෙටියෙන් පහදන්න.

අ) මූලික ආර්ථික ප්‍රශ්න

ආ) නිෂ්පාදන හැකියාව

ඉ) ආර්ථික බදු කුලිය

ඊ) වෙළෙඳපොල ක්‍රමය අසමත්වීමට බලපාන හේතු

උ) අර්ථක්‍රමයක් සතු මූලික කාර්ය (ලකුණු 04 බැගින්)

04. කල්පිත වෙළෙඳපොලක 'X' නම් භාණ්ඩය පිළිබඳ පහත සටහන මගින් තොරතුරු සපයා ඇත. (මිල (P) රුපියල් සහ ප්‍රමාණය (Q) කිලෝ ග්‍රෑම්)




ඉහත සටහන ආශ්‍රයෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ ගොඩනගන්න.

ii. පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය සොයන්න.

iii. මිල රුපියල් 70 දී අධි සැපයුම් ප්‍රමාණය සහ මිල රුපියල් 30 දී අධි ඉල්ලුම් ප්‍රමාණය ගණනය කරන්න.

iv. සැපයුම් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 150 ක් වන විට කළු කඩ මිල සහ ඉල්ලුම් මිල රුපියල් 90ක් වන විට සැපයුම් ප්‍රමාණය කොපමණද?

v. මිල රුපියල් 40 සහ 80 අතර මිල ඉල්ලුම් නම්‍යතාව සහ සැපයුම් නම්‍යතාව ගණනය කරන්න. (එක් කොටසකට ලකුණු 04 බැගින්)

05. අ) කෙටි කාලීන නිෂ්පාදන අවධි සහ නිෂ්පාදන ඵල මොනවාද යන්න යෝග්‍ය රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ) නිෂ්පාදන ආයතනයකට අදාළ අභ්‍යන්තර සහ බාහිර පිරිමැසුම් මොනවාද? නිදසුන් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

ඉ) කෙටි කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍ර හා ආන්තික පිරිවැය වක්‍ර යොදාගනිමින් දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රය හා ආන්තික පිරිවැය වක්‍රය ව්‍යුත්පන්න කෙරෙන ආකාර උචිත රූපසටහන් භාවිත කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

06. අ) 'පූර්ණ තරඟකාරී ආයතනයක් මිල ගනුවෙක් වේ.' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ) පූර්ණ තරඟකාරී වෙළෙඳපොල මාදිලිය තුළ ආයතනයක කෙටි කාලීන හා දිගු කාලීන සමතුලිත කොන්දේසි මොනවාද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 06)

ඉ) පූර්ණ තරඟකාරී වෙළෙඳපොලෙහි ආයතනයක සහ කර්මාන්තයේ දිගු කාලීන සැපයුම් වක්‍රය ලබාගන්නා ආකාරය රූප සටහන් ආශ්‍රයෙන් පෙන්වා දෙන්න. (ලකුණු 08)

07. අ) ඒකාධිකාරී වෙළෙඳපොලක් බිහිවීම සඳහා බලපාන සාධක පහක් සඳහන් කරන්න. (ලකුණු 05)

ආ) කෙටි කාලයේදී ඒකාධිකාරී ආයතනයකට සෑමවිටම අතිප්‍රමාණ ලාභ ලැබිය හැකිද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 07)

ඉ) 'ඒකාධිකාරී ආයතනයකට දිගු කාලයේදී ප්‍රශස්ත ධාරිතාව ඉක්මවා කටයුතු කිරීමේ හැකියාව පවතී.' මෙම ප්‍රකාශය උචිත රූප සටහනක් භාවිතයෙන් පැහැදිලි කරන්න. ' (ලකුණු 08)

08. අ) සමපේක්ෂණ චේතනාවෙන් මුදලට ඇති ඉල්ලුම හා පොළී අනුපාතය අතර පවත්නා සම්බන්ධය කුමක්ද යන්න උචිත රූප සටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ) ශ්‍රී ලංකා මහ බැංකුව පොළී අනුපාතිකය පහළ දැමීමෙන් ඇතිවිය හැකි ආර්ථික ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 06)

ඉ) පරස්පර අරමුණු දෙකක් ලුහුබැඳයාමේදී වාණිජ බැංකුවක් තම වත්කම් ව්‍යුහය කළමනාකරණය කරගන්නේ කෙසේද? (ලකුණු 08)

09. අ) සාර්ව ආර්ථිකයේ ආදායම, නිෂ්පාදනය හා වියදම යන සංරචකවල චක්‍රීය ප්‍රවාහ රූප සටහනක් මගින් විස්තර කරන්න. (ලකුණු 06)

ආ) 'S+Td+M= I+G+X' යන සමීකරණයේ විචල්‍ය අතර පවත්නා සම්බන්ධය කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

ඉ) අර්ථ ක්‍රමයක ජාතික ආදායම ගණනය කිරීමේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 08)

10. කැමති ඕනෑම මාතෘකා හතරකට (04) කෙටි සටහන් ලියන්න.

i. නිෂ්පාදන සාධකයක් වශයෙන් 'භූමියෙහි' ආර්ථික ලක්ෂණ
ii. මිල ස්ථායිකරණය
iii. ද්‍රවශීලතාව
iv. අහිමිවන සුබසාධනය (deadweight loss)
v. ශුද්ධ පොදු භාණ්ඩ
vi. දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය (ලකුණු 05 බැගින්)

************************************